**CRAFTS RESEARCH FORUM 2026**

**හස්ත කර්මාන්ත පර්යේෂණ පරිසංවාදය 2026**

**හස්ත කර්මාන්ත උරුමය ආශ්‍රිත පර්යේෂණ පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය හා ප්‍රදර්ශනය**

**තේමාව**

**සාම්ප්‍රදායික උරුමය පිළිබඳ පර්යේෂණ, නවෝත්පාදනය හා ප්‍රජාව අතර සම්බන්ධතාවය ගොඩනැඟීම මඟින් හස්ත කර්මාන්ත සම්ප්‍රදායන් සංරක්ෂණය**

📅 **දිනය:** 2026 ඔක්තෝබර් 30
📍 **ස්ථානය:** සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය (UVPA)

---

## හැඳින්වීම

හස්ත හා සංස්කෘතික උරුමයන් පිළිබඳ පර්යේෂණ, ප්‍රායෝගික ක්‍රියාකාරකම් හා නවෝත්පාදන සහ ප්‍රජා සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා සඳහා වූ ජාත්‍යන්තර මට්ටමේ වේදිකාවක් සකස් කිරීම මෙම වැඩසටහන මගින් අපේක්ෂා කෙරේ. මෙම පර්යේෂණ පරිසංවාදය මඟින් පර්යේෂකයන්, ශාස්ත්‍රඥයින්, විද්වතුන්, ශිල්පීන්, නිර්මාණකරුවන්, කලාකරුවන්, ප්‍රතිපත්ති සම්පාදකයින්, ප්‍රජා සංවර්ධන වෘත්තිකයන් සහ සංස්කෘතික ආයතන ඒකාබද්ධ කරමින් නූතන සමාජය තුළ හස්ත කර්මාන්තවල විකාශනය හා භූමිකාව පිළිබඳව විමර්ශනය කිරීමට අවස්ථාව සලසයි.

මෙම වැඩසටහන මගින් පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කිරීම්, ප්‍රායෝගික ක්‍රියාකාරකම් පදනම් වූ ඉදිරිපත් කිරීම්, ප්‍රදර්ශන, හස්ත කර්මාන්ත සජීවී නිරූපණ, වැඩමුළු සහ මහජන සහභාගීත්ව ක්‍රියාකාරකම් ඇතුලත්ව දේශීය හස්ත කර්මාන්ත උරුමය සංරක්ෂණය කිරීම හා ඒ සම්බන්ධ වන සංවාදය ජනගත කරමින් අන්තර්ජාතික මට්ටමේ සංවාදයක් ගොඩනැඟීමට අවශ්‍ය පරිසරය සකස් කිරීම සිදුවේ.

---

## අරමුණු

- සාම්ප්‍රදායික හා නූතන හස්ත කර්මාන්ත භාවිතාවන් පිළිබඳ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම.
- හස්ත කර්මාන්ත උරුමය ලේඛනගත කිරීම හා සංරක්ෂණය දිරිමත් කිරීම.
- සාම්ප්‍රදායික හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයන් තුළ නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීම.
- හස්ත කර්මාන්ත, ප්‍රජාවන් සහ සංස්කෘතික අනන්‍යතාව අතර සම්බන්ධතාවය ශක්තිමත් කිරීම.
- පර්යේෂකයන් හා වෘත්තිකයන් අතර අන්තර්විෂය සහයෝගීතාව දිරිමත් කිරීම.
- දැනුම හුවමාරු කර ගැනීම හා මහජන සහභාගීත්වය සඳහා අවස්ථා නිර්මාණය කිරීම.

---

## පර්යේෂණ පරිසංවාදයේ ක්‍රියාකාරකම්

- පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කිරීම්
- හස්ත කර්මාන්ත ප්‍රදර්ශන
- සජීවී හස්ත කර්මාන්ත නිරූපණය කිරීම
- වැඩමුළු
- ශ්‍රව්‍ය දෘශ්‍ය ඉදිරිපත් කිරීම්
- වාර්තා චිත්‍රපට ප්‍රදර්ශන
- ප්‍රජා සහභාගීත්ව වැඩසටහන්
- ජාලගත කිරීමේ සැසි (Networking Sessions)

---

## පර්යේෂණ පරිසංවාදයේ යෝජිත තේමාවන් (තේමාත්මක ක්ෂේත්‍ර)

1. **සාම්ප්‍රදායික හස්ත කර්මාන්ත සහ නූතන අනුවර්තනය**
   සාම්ප්‍රදායික හස්ත කර්මාන්ත නූතන සංදර්භයන්ට කෙසේ විකාශනය වේ ද යන්න විමර්ශනය කිරීම.

2. **ප්‍රායෝගික පදනම් වූ හස්ත කර්මාන්ත පර්යේෂණ**
   නිර්මාණාත්මක ක්‍රියාකාරකම් සහ හස්ත කර්මාන්ත නිර්මාණ ක්‍රියාවලිය පදනම් වූ පර්යේෂණ

3. **හස්ත කර්මාන්ත, ප්‍රජාව සහ සංස්කෘතික අනන්‍යතාව**
   දේශීය අනන්‍යතාව, ප්‍රජාව හා සංස්කෘතික අඛණ්ඩතාව ගොඩනැගීමේ දී හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ කාර්යභාරය

4. **හස්ත කර්මාන්ත ලේඛනගත කිරීම සහ ඩිජිටල් සංරක්ෂණය**
   හස්ත කර්මාන්ත උරුමයන් සංරක්ෂණය කිරීම සඳහා ලේඛණ ගත කිරීම්, ඩිජිටල්කරණය හා තාක්ෂණික යෙදවුම් භාවිතය

5. **තිරසාරභාවය සහ නිර්මාණාත්මක ආර්ථිකය**
   තිරසාර සංවර්ධනය, ජීවනෝපාය සංවර්ධනය හා සංස්කෘතික බැඳියාවන් සහිත කර්මාන්ත සඳහා හස්ත කර්මාන්ත ශිල්පය යොදාගැනීම හා භාවිතාව

6. **අන්තර්විෂය හා බහුවිෂය සහයෝගී ක්‍රියාකාරකම්**
   විවිධ අධ්‍යයන හා ශාස්ත්‍රීය ක්ෂේත්‍රයන් සමඟ හස්ත කර්මාන්ත ඒකාබද්ධ කරන සහයෝගී ප්‍රවේශයන්

---

## ඉදිරිපත් කළ හැකි කාණ්ඩ

- පර්යේෂණ පත්‍රිකා
- ප්‍රායෝගික පර්යේෂණ ව්‍යාපෘති (Practice based research projects)
- හස්ත කර්මාන්ත සජීවී නිරූපන (Crafts demonstration)

- වැඩමුළු
- ප්‍රදර්ශන සහ ස්ථාපන
- ප්‍රජා ක්‍රියාකාරකම් සිද්ධි අධ්‍යයන
- ශ්‍රව්‍ය දෘශ්‍ය ඉදිරිපත් කිරීම්
- වාර්තා චිත්‍රපට ප්‍රදර්ශන

---

## සාරාංශ / යෝජනා ඉදිරිපත් කිරීම

මෙම වැඩසටහනට සහභාගීවන්නන් සමාලෝචනය (Review) සඳහා පර්යේෂණ සාරාංශ (Abstract) හා මූලික යෝජනා පත්‍ර (preliminary proposal) වචන 150 – 300 කින් යුත් Word හා Pdf ආකෘති දෙකෙන්ම නියමිත දිනට පෙර ඉදිරිපත් කල යුතුය. පිලිගැනීමේ දැනුම් දීම (Acceptance notification) අදාල කතෘවරුන් විසින් අදාල මාර්ගෝපදේශයන්ට අනුකූලව විස්තීර්ණ සාරාංශය (Extended Abstract) හා විස්තීරණ යෝජනා (Extended proposal) ඉදිරිපත් කළ යුතුය.

---

# 01. විස්තීර්ණ සාරාංශය (Extended Abstract)

### 1. පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කිරීම

සහභාගීවිය හැකි කාණ්ඩ : පර්යේෂකයන්, ශාස්ත්‍රඥයින්, පශ්චාත් උපාධි සහ උපාධි අපේක්ෂක සිසුන්

**අන්තර්ගත විය යුතු කරුණු:**

- මාතෘකාව
- කර්තෘ(වරු) සහ අනුබද්ධ ආයතනය
- පසුබිම / ගැටලු ප්‍රකාශය
- අරමුණු
- ක්‍රමවේදය
- ප්‍රධාන සොයාගැනීම් හෝ අපේක්ෂිත ප්‍රතිඵල
- මූලපද 3 – 5

අඩංගු විය යුතු වචන සංඛ්‍යාව 1000 – 1500 ත් අතර විය යුතුය.

අරමුණ - ශාස්ත්‍රීය පර්යේෂණ පත්‍රිකා හා සංකල්පීය අධ්‍යයන ඉදිරිපත් කිරීම සඳහා

### 2. ව්‍යුහගත ඉදිරිපත් කිරීම

සහභාගීවිය හැකි කාණ්ඩ : හස්ත කර්මාන්ත ශිල්පීන්, කලාකරුවන්, නිර්මාණකරුවන්, මෝස්තර සම්පාදකයන් ප්‍රජා පර්යේෂකයන්

**අන්තර්ගත විය යුතු කරුණු:**

- ඉදිරිපත් කිරීමේ මාතෘකාව
- පසුබිම
- අරමුණ
- අරමුණු
- හස්ත කර්මාන්ත නිෂ්පාදන ක්‍රියාවලිය / ක්‍රමවේදය
- භාවිත කරන අමුද්‍රව්‍ය
- ප්‍රතිඵල / නවසොයාගැනීම්
- හස්ත කර්මාන්ත සංරක්ෂණයට ඇති අදාලත්වය
- ඡායාරූප (විකල්ප)

අඩංගු විය යුතු වචන සංඛ්‍යාව 1000 – 1500

අරමුණ - හස්ත කර්මාන්ත නිර්මාණ ක්‍රියාවලිය අධ්‍යයනය කිරීම හා ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම මෙම ඉදිරිපත් කිරීම සඳහා පර්යේෂණ පත්‍රිකා ආකෘතිය අදාල නොවේ.

### 3. ප්‍රායෝගික පාදක පර්යේෂණ

සහභාගීවිය හැකි කාණ්ඩ : හස්ත කර්මාන්ත ශිල්පීන්, මෝස්තර සම්පාදකයන්, ප්‍රජා පර්යේෂකයන්

**අන්තර්ගත විය යුතු කරුණු:**

- ව්‍යාපෘති මාතෘකාව
- සංකල්ප සටහන
- පර්යේෂණ ගැටළුව
- ප්‍රායෝගික ක්‍රමවේදය
- හස්ත කර්මාන්ත නිර්මාණ ක්‍රියාවලිය ලේඛනගත කිරීම
- ඡායාරූප / ඇඳීම් / ආදර්ශ
- පරාවර්තන ප්‍රකාශය

වචන සංඛ්‍යාව 1000 – 1500 අතර පර්යේෂණ පත්‍රිකාවක් සමඟ දෘශ්‍ය ලේඛනගත කිරීම / ඡායාරූප මගින් ලේඛනගත කිරීම් අඩංගු විය යුතුය.

අරමුණ - හස්ත කර්මාන්ත නිර්මාණකරණය සම්බන්ධ පර්යේෂණ ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම.

---

## 2. යෝජනා (Proposals)

### 1. ප්‍රදර්ශන යෝජනාව

සහභාගීවිය හැකි කාණ්ඩ : හස්ත කර්මාන්ත ශිල්පීන් හා ශිල්ප සංවිධාන

**අන්තර්ගත විය යුතු කරුණු :**

- ප්‍රදර්ශනයේ මාතෘකාව
- සංකල්ප ප්‍රකාශය
- ප්‍රදර්ශන විස්තරය
- තාක්ෂණික අවශ්‍යතා
- කෘතිවල ඡායාරූප
- කලාකරුවාගේ හැඳින්වීම

අරමුණ: හස්ත කර්මාන්ත නිර්මාණ ප්‍රදර්ශනය හා හස්ත කර්මාන්ත හා බැඳුණු උරුමය ප්‍රදර්ශනය කිරීම

## 2.වැඩමුළු යෝජනාව

සහභාගීවිය හැකි කාණ්ඩ : ගුරු ශිල්පීන් හා පර්යේෂකයන්

අන්තර්ගත විය යුතු කරුණු :

- වැඩමුළු මාතෘකාව
- ඉගෙනුම් අරමුණු
- වැඩමුළු ආකෘතිය
- ඉලක්කගත කණ්ඩායම්
- කාලසීමාව
- භාවිත උපකරණ හා අමුද්‍රව්‍ය

අරමුණු: ප්‍රායෝගික අත්දැකීම් මගින් ඉගෙනීම සහ දැනුම හුවමාරු කිරීමේ ක්‍රියාකාරකම් සඳහා අවස්තාව ලබාදීම

## 3.ප්‍රදර්ශන (Demonstration) යෝජනාව

සහභාගීවිය හැකි කාණ්ඩ :සාම්ප්‍රදායික හස්ත කර්මාන්තකරුවන්

- නියෝජනය කරන හස්ත කර්මාන්ත සම්ප්‍රදාය
- ඉදිරිපත් කිරීම පිළිබඳ විස්තරය
- සංස්කෘතික වැදගත්කම
- භාවිත උපකරණ හා අමුද්‍රව්‍ය
- කාලසීමාව

අරමුණ:සාම්ප්‍රදායික හස්ත කර්මාන්තවල පාරම්පරික ශිල්ප ක්‍රම හා දැනුම ගවේශණය හා ඉදිරිපත් කිරීම

## වැදගත් දින

| ක්‍රියාකාරකම | දිනය |
|---|---|
| පර්යේෂණ පත්‍රිකා හා යෝජනා පත්‍ර කැඳවීම | 2026 ජූලි 03 |
| සාරාංශ යෝජනා භාරගැනීමේ අවසන් දිනය | 2026 ජූලි 30 |
| පිළිගැනීම දැනුම්දීම | 2026 සැප්තැම්බර් 01 |
| විස්තීර්ණ සාරාංශ හා විස්තීර්ණ යෝජනා ඉදිරිපත් කිරීම | 2026 සැප්තැම්බර් 30 |
| සම්මන්ත්‍රණය පැවැත්වෙන දින | 2026 ඔක්තෝබර් 30 |

## සහභාගී විය හැකි පාර්ශවයන්

- පර්යේෂකයන්
- විද්වතුන්
- සිසුන්
- ශිල්පීන්
- නිර්මාණකරුවන්
- කලාකරුවන්
- කෞතුකාගාර වෘත්තිකයන්
- සංස්කෘතික නිලධාරීන්
- ප්‍රජා සංවිධාන
- ස්වාධීන පර්යේෂකයන්
- ප්‍රතිපත්ති සම්පාදකයන්
- ව්‍යවසායකයන්

## සංවිධායකයින්

ජාතික ශිල්ප සභාව හා සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

## විස්තීරණ සාරාංශ ඉදිරිපත් කළ යුතු ආකාරය

- විස්තීරණ සාරාංශ වචන 1000 - 1500 ප්‍රමාණයකින් යුක්ත විය යුතුය.
- සියලුම විස්තීරණ සාරාංශ හා විස්තීරණ යෝජනා හස්ත කර්මාන්ත උරුමය, සංරක්ෂණය, හස්ත කර්මාන්ත ආශ්‍රිත නවෝත්පාදන, තිරසාර භාවය හා ප්‍රජා සහභාගිත්වය යන ප්‍රධාන ක්ෂේත්‍ර වලට අදාළව එම ක්ෂේත්‍රයන් නිරූපණය වන පරිදි ඉදිරිපත් කළ යුතුය.

## තොරතුරු ලබා ගත හැකි මාධ්‍ය

- සම්මන්ත්‍රණ වෙබ් අඩවිය - https://vpa.ac.lk
- දුරකථන අංකය - 011 – 2785282, 077- 2953079
- විද්‍යුත් තැපැල - craftsforum2026@gmail.com
- වට්ස් ඇප් අංකය - 077- 2953079
- මුහුණු පොත - National Crafts Council – NCC (https://www.facebook.com/share/18b496mFX3/)

**"අනාගත පරපුර සඳහා හස්ත කර්මාන්ත උරුමය සංරක්ෂණය කිරීමට, ලේඛනගත කිරීමට, පර්යේෂණ කිරීමට සහ නව අර්ථකථනයක් ලබා දීමට අප හා එක්වන්න."**